**තේ ශක්ති අරමුදලේ ගණුදෙනු වාර්තාව - 2019**

-------------------------------------------------------

තේ ශක්ති අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවත්, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2016 ,2017, 2018 හා 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2. විගණන නිරීක්ෂණ**

--------------------

**2.1 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වාගෙනයාම**

--------------------------------------------------

අරමුදලේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ලෙජර ගිණුම් පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

-----------------------------------

අරමුදල විසින් අවසන්වරට විගණනයට ඉදිරිපත් කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම් සහ වගකීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **විස්තරය** | **වටිනාකම (රු.)** |
| --- | --- |
| **වත්කම්** | |
| ජංගම නොවන වත්කම් | 350,332,493 |
| ජංගම වත්කම් | 346,460,128 |
| **මුළු වත්කම්** | **696,792,621** |

**වගකීම්**

**-------**

| | |
|---|---|
| ස්කන්ධ ප්‍රාග්ධන | (111,648,540) |
| ජංගම නොවන වගකීම් | 481,088,651 |
| ජංගම වගකීම් | 327,352,510 |
| **මුළු වගකීම්** | **696,792,621** |

**2.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම**

**-----------------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තේ ශක්ති අරමුදල අඛණ්ඩව අලාභ ලබා තිබූ අතර අරමුදලේ ස්කන්ධ ප්‍රාග්ධනය ක්‍රමානුකූලව අඩු වෙමින් පැවැතුණි. ඒ අනුව 2011 වර්ෂයේ දී මිලියන 553.04 ක් වූ ස්කන්ධ ප්‍රාග්ධනය 2015 වර්ෂයේ දී රු. මිලියන 111.65 ක සෘණ ස්කන්ධ ප්‍රාග්ධනයක් බවට පත්ව තිබුණි.<br><br>මෙම තත්ත්වයන් මත අංක අමප/16/1224/726/015-I දරන 2016 ජුලි 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු එදින සිට අත්හිටුවා එහි කටයුතු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පවරා යෝජනා 09 කින් සමන්විත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි.<br><br>කර්මාන්තශාලා බදුදීමෙන් ලැබෙන ආදායමෙන් කොටස් හිමියන්වෙත ප්‍රතිලාභ ලබා දීමට හා සුභසාධන රක්ෂණ අරමුදලෙන් කර්මාන්තශාලාවල කටයුතු සඳහා යෙදවූ රු.මිලියන 135 ක මුදල් නැවත එම අරමුදල වෙත ලබාදීමට කටයුතුකිරීම සහ ඉන් අනතුරුව ඉතිරිවන බදු ආදායම මුදල් අමාත්‍යාංශය වෙත බැරකිරීම තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමේ අපේක්ෂාව විය.එසේවුවද අපේක්ෂිත අයුරින් කර්මාන්තශාලා බදු ආදායම් ලබාගැනීමට අපොහොසත් වීම නිසා අරමුදල ප්‍රතිව්‍යුහගතකර වසර 4 ක් පමණ ගත වුවද උක්ත අරමුණුකරා ලඟාවීමට අරමුදලට නොහැකි වී තිබුණි. | බදු හා කළමනාකරණ ආදායම් අපේක්ෂිත ආකාරයට නොලැබීම හේතුවෙන් ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණු අපේක්ෂිත කාල වකවානු තුළ ඉටු කර ගැනීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් මේ වනවිට රු. මිලියන 135 ක් වන සුභ සාධන රක්‍ෂණ අරමුදල ගොඩනැගීම සඳහා බදු හා කළමනාකරණ ආදායම මඟින් රු. මිලියන 95 ක පමණ මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර අදාළ අරමුදල ගොඩනගමින් පවතින අතර, ඉදිරියේදී අපේක්ෂිත අරමුණු කරා ලඟාවීමට අපේක්‍ෂා කරනු ලැබේ. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොටස් හිමියන්වෙත ප්‍රතිලාභ ලබා දීමට හා සුභසාධන රක්ෂණ අරමුදල නැවත ගොඩනැගීම සඳහා පියවර ගත යුතුය. |

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු. රෙ. 507(2) | සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු වුවත්, 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වෙමි.<br>තේ ශක්ති අරමුදලේ ප්‍රධාන කාර්යාලයේ වත්කම්වලින් කොටසක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති අතර, අනෙක් කොටස වැවිලි අමාත්‍යාංශය වෙත පවරා ඇත. එම වත්කම් අදාළ ආයතනය මඟින් වාර්ෂික සත්‍යාපනයක් සිදුකර විගණකාධිපතිවරයා වෙත වත්කම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.<br><br>තේ ශක්ති අරමුදල සතු අනෙකුත් තේ කම්හල්, පොහොර ගබඩාව හා මාවරල වත්ත බදු හා කළමනාකරණ ගිවිසුම් මඟින් බාහිර පාර්ශවයන් වෙත භාණ්ඩ ලැයිස්තු ලේඛන සමග භාරදී ඇත. එම වත්කම් තේ ශක්ති අරමුදලේ කණිෂ්ඨ සහකාර කම්හල් නිලධාරී මඟින් සත්‍යාපනය කරන අතර, එහි පිටපත් ඉදිරියේදී ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. | අරමුදල සතු කර්මාන්තශාලාවල ස්ථාවර වත්කම් වාර්ෂිකව සමීක්ෂණය කර වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2.5 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා ලංකා බැංකුවේ අංක 2937124 දරන ජංගම ගිණුමේ රු.මිලියන 13 කට ආසන්න මුදලක් පැවතුණු අතර එම කාලය තුළ කෙටිකාලීන තැන්පත්වල ආයෝජනය නොකිරීම හේතුවෙන් අරමුදලට පොළී ආදායමක් ලැබීමට තිබූ අවස්ථාව අහිමිවී ඇති බව නිරීක්ෂණය කෙරේ. | එකඟ වෙමි.<br>සුහ සාධන රක්ෂණ දායකත්වය ලබා ඇති සාමාජිකයන් වාර්ෂිකව ටෙන්ඩර් ක්‍රමවේදය අනුගමනය කරමින් රක්ෂණ ආයතනයක් තෝරාගෙන සමූහ රක්ෂණයක් සිදුකරනු ලබන අතර, එය සෑම වසරකම මාර්තු මස අවසානයේදී සිදු කිරීමට නියමිතව ඇත. ඒ සඳහා රු.මිලියන 13 ක පමණ මුදලක් අවශ්‍ය වන බැවින්, එම අවශ්‍යතාව වෙනුවෙන් එම මුදල අදාළ ගිණුමේ රඳවා ගෙන පැවති අතර, එම වසරේ ටෙන්ඩර් ක්‍රියාවලියේ සිදුවූ ප්‍රමාදයන් හේතුවෙන් අදාළ මුදල ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී ඇත. | අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන කෙටිකාලීන තැන්පත්වල ආයෝජනය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙනියාය තේ කම්හල 2016 වර්ෂයේදීද , මාවරල වත්ත හා මාවරල තේ කම්හල 2017 වර්ෂයේදීද ග්‍රීන්ලයින් ෆස්ට් පුද්ගලික සමාගමට බදු පදනම මත පවරාදී තිබූ අතර එම බදු දේපළ වෙනුවෙන් 2017 වර්ෂයේ සිට අයවිය යුතු බදු කුලී ප්‍රමාද ගාස්තු රු.100,888,720 ක් ද සමාලෝචිත වර්ෂයේ බදු කුලිය රු.21,469,837 ක්ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි. | එකඟ වෙමි.<br>මාවරල කම්හල බදු පදනම මත ලබාදෙන අවස්ථාවේදී විශාල කාලයක් තේ නිෂ්පාදනය සිදු නොකොට තිබූ හෙයින් එම කම්හල තේ නිෂ්පාදන තත්ත්වයට පත් කිරීම සඳහා විශාල මුදලක් ආයෝජනය කිරීමට සිදුවී ඇත. කෙසේ වෙතත් මේ වනවිට කම්හල තේ නිෂ්පාදන තත්ත්වයට පත්කොට ඇතත් මේ දක්වා බදුකරු තේ නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොමැත. මේ තත්ත්වය යටතේ හිඟ බදු වාරික සම්බන්ධව දිගින් දිගටම අදාළ බදුකරු සමග සාකච්ඡා කරමින් පවතී.<br>දෙනියාය කම්හලේ පූර්ණ ධාරිතාවයක් ක්‍රියාත්මක කිරීම සඳහා එම ප්‍රදේශයේ ප්‍රමාණවත් දළු නොලැබෙන බැවින්, බදු වාරික මුදල සංශෝධනය කරදෙන ලෙස අවස්ථා කිහිපයකදී ඉල්ලීම් කර ඇත. ඒ සම්බන්ධව විශේෂ දැනුම ඇති බාහිර ආයතනවල සහාගීත්වයෙන් යුත් කමිටුවක් මගින් අධ්‍යයනය කර | බදු ගිවිසුමේ ප්‍රතිපාදන ප්‍රකාර නොපමාව හිඟ බදු වාරික අය කරගත යුතුය. |

| | | |
|---|---|---|
| | වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට මේ වනවිට තීරණය කර ඇත.<br>මාවරල වත්ත බදු ගැණුම්කරු විසින් ලබාගැනීමෙන් අනතුරුව ඇතිවූ නියන් තත්ත්වය හේතුවෙන් විශාල වගා ප්‍රමාණයක් හානියට හා එම ඉඩම මගින් ඉදිවූ නව මාර්ගය හේතුවෙන් වගා හානිවීම හේතුවෙන් හිඟ බදු වාරික ගෙවීම සඳහා සහන ඉල්ලා ඇත. අදාළ කරුණ සමාලෝචනය කිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධව තීරණය කිරීමට කටයුතු කරමින් පවතී. | |
| (ආ)කොත්මලේ තේ ශක්ති කර්මාන්තශාලාවෙහි කළමණාකාරීත්වය 2017 වර්ෂයේ සිට රයිගම් ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගමට බදු පදනම මත පවරා දී තිබූ අතර එම සමාගමෙන් 2019 දෙසැම්බර් 31 දක්වා රු.63,945,450 ක බදු මුදල හා ප්‍රමාද ගාස්තු අය වීමට පැවතියද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම මුදල් අයකර ගෙන නොතිබුණි. | එකඟ වෙමි.<br>කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා කළමනාකරණ ගැණුම්කරු අපොහොසත් වී ඇති අතර, කම්හල සඳහා ප්‍රමාණවත් දළු සපයා ගැනීම ගැටළුවක් වී ඇති අතර, කම්හලේ කළමනාකරණ ගාස්තු මුදල කම්හලේ ධාරිතාව මත තීරණය වීම නිසා ඉහළ අගයක් ගෙන ඇත. මේ තත්ත්වය යටතේ කම්හල පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන ආකාරය පිළිබඳව කළමනාකරණ ගැණුම්කරුවන්ගෙන් යෝජනා ලබාගෙන ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට තීරණය කර ඇත. | බදු ගිවිසුමේ ප්‍රතිපාදන ප්‍රකාර නොපමාව හිඟ බදු වාරික අය කරගත යුතුය. |
| (ඇ) 2017 වර්ෂයේදී අරමුදල රයිගම් ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගම සමඟ එළඹි අවබෝධතා ගිවිසුම අනුව මහවැලි තේ ශක්ති කර්මාන්තශාලාවේ කළමණාකාරීත්වය එම සමාගමට භාරදී තිබුණද තේ දළු සපයාගැනීමේ දුෂ්කරතාවය හා ආදායමින් වියදම් පියවා ගැනීමට නොහැකි වීමත් යන හේතුන් මත 2018 ජුනි 14 දින කර්මාන්තශාලාව නැවත තේ ශක්ති අරමුදලට භාරදී තිබුණි. එසේ වුවද මහවැලි තේ කර්මාන්තශාලාව සඳහා 2017 හා 2018 වර්ෂ වෙනුවෙන් රු.5,327,950 ක් වූ බදු මුදල් සහ ප්‍රමාද ගාස්තු ලෙස රු.8,313,293 ක් වශයෙන් එකතුව | එකඟ වෙමි.<br>මෙම කම්හල මේ වනවිට තේ ශක්ති අරමුදල වෙත නැවත පවරා ගෙන නව ගැණුම්කරුවකු වෙත කළමනාකරණය පවරා ඇත. හිඟ කළමනාකරණ ගාස්තු පැවති බදුකරුගෙන් කම්හල පවරා ගැනීමේදී ඔහු විසින් තබා තිබූ ආරක්ෂිත තැන්පතු මුදල හිඟ කළමනාකරණ ගාස්තු වෙනුවෙන් රඳවා ගෙන ඇත. එමගින් රු. 2,907,000 ක මුදලක් හිඟ මුදලින් අයකර ගෙන ඇත. | බදු ගිවිසුමේ ප්‍රතිපාදන ප්‍රකාර නොපමාව හිඟ බදු වාරික අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| රු.13,691,243 ක් තේ ශක්ති අරමුදලට අයකර ගෙන නොතිබුණි. | | |
| (ඇ) අරමුදලට අයත් වලහන්දූව තේ කර්මාන්තශාලාව 2017 ජුනි 19 වන දින මෙල්මෑන් පුද්ගලික සමාගමට බදු පදනම මත ලබාදී තිබුණද වලහන්දූව තේ කර්මාන්තශාලාව පිහිටි ඉඩමේ පවතින කළමණාකරුගේ බංගලාව රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් භාවිතා කරමින් පවතින බැවින් එය බදු ගැණුම්කාර පාර්ශවයට ලබාදීමට නොහැකි වී තිබුණි. කම්හල සඳහා අපේක්ෂිත ආයෝජනය සිදු කිරීමට එම කළමණාකරුගේ බංගලාව අවශ්‍ය බව බදු ගැණුම්කාර පාර්ශවය විසින් දැනුම්දීම හේතුවෙන් 2018 ජුනි 01 වන දින කම්හල නැවත අරමුදල වෙත පවරා ගන්නා ලදී. සමාලෝචිත වර්ෂයේදී එම බදු ගිවිසුම අවලංගු කර වෙනත් පාර්ශවයකට එම කම්හල බදු පදනම මත ලබාදී තිබුණද 2017 හා 2018 වර්ෂ සඳහා මෙල්මෑන් පුද්ගලික සමාගමෙන් අයවිය යුතු කර්මාන්තශාලා බදු හා ප්‍රමාද ගාස්තු රු.13,987,200 ක් අයකර ගෙන නොතිබුණි. | එකඟ වෙමි.<br>මෙම කම්හල මෙල්මෑන් පුද්ගලික සමාගමෙන් නැවත පවරා ගන්නා අවස්ථාවේදී අදාළ සමාගම විසින් කම්හලේ ආරක්ෂිත තැන්පතු මුදල හිඟ කළමනාකරණ ගාස්තු වෙනුවෙන් රඳවා ගෙන ඇති අතර, ඒ මගින් රු.4,230,000 ක මුදලක් අයකර ගෙන ඇත. | බදු ගිවිසුමේ ප්‍රතිපාදන ප්‍රකාරව නීතිමය කටයුතු කඩිනමින් ඉටුකර හිඟ මුදල් අය කර ගත යුතුය. |
| (ඉ) රයිගම් කෝරළේ තේ ශක්ති කම්හල දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතියට බදු දී තිබූ අතර බදු ගිවිසුමේ කොන්දේසි 2 ප්‍රකාරව මාස 6 ක රු.1,500,000 ක් වූ බදු කුලිය ආපසු ගෙවන තැන්පත් ලෙස බදු ගැනුම්කාර පාර්ශවය විසින් බදු, දීමනාකාර පාර්ශවය වෙත ගෙවිය යුතු වුවත් 2016 වර්ෂයේ සිට විගණිත දින දක්වාම එම මුදල් අය කර ගෙන නොතිබුණි. එමෙන්ම මෙම කර්මාන්තශාලාව සඳහා 2018 වර්ෂයේ සිට රු.5,156,640 ක බදු වාරිකද තේ ශක්ති අරමුදලට අයවිය යුතු වුවද සමාලෝචිත | මේ වනවිට එම කම්හල නැවත තේ ශක්ති අරමුදල වෙත පවරා ගෙන රයිගම් කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙත නව කළමනාකරණය පැවරීමට කටයුතු කර ඇත. දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතිය විසින් කම්හල බදු පදනම මත ලබා ගෙන තිබූ කාල පරිච්ඡේදයට අදාළව හිඟ දළු මුදල් වසර 05ක් ඇතුලත ගෙවීම සඳහා නව කළමනාකරණ ගැණුම්කාර පාර්ශවය වන රයිගම් කුඩා තේ වතු සංවර්ධන සමිතිය එකඟ වී ඇති අතර, එම හිඟ දළු මුදල් තුල ඇති දික්හේන කුඩා තේවතු සංවර්ධන සමිතිය වෙත ගෙවිය යුතු හිඟ දළු මුදලින්, දික්හේන කුඩා තේවතු සංවර්ධන සමිතිය මඟින් තේ ශක්ති අරමුදල වෙත ගෙවිය යුතු හිඟ බදු | බදු ගිවිසුමේ ප්‍රතිපාදන ප්‍රකාරව නීතිමය කටයුතු කඩිනමින් ඉටුකර හිඟ මුදල් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| වර්ෂය අවසානය දක්වා එම මුදල් අය කර ගෙන නොතිබුණි. | මුදල අඩුකර තේ ශක්ති අරමුදල වෙත සෘජුව ගෙවීමට රයිගම් කුඩා තේ වතු සංවර්ධන සමිතිය හා දික්හේන කුඩා තේවතු සංවර්ධන සමිතිය අවබෝධතා ගිවිසුම මගින් එකඟ වී ඇත. | |

## 3.2 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමට අනුමැතිය ලබාදෙන ලද 2016 ජුලි 13 දිනැති අංක අමප/16/1224/726/015-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණවල දක්වා ඇති පරිදි ස්ථිර කාර්යය මණ්ඩලය අමාත්‍යාංශය යටතේ පවත්නා වෙනත් ආයතනවලට අනුයුක්ත කිරීමේදී අදාළ ආයතනයේ කැමැත්ත මත සහ කාර්ය මණ්ඩල වැටුප් හා වේතන එකී ආයතනවල පවත්නා අයවැය ප්‍රතිපාදන මත ගෙවීමට කටයුතු කළ යුතුය. එසේ වුවද කළමනාකරණ සහකාර නිලධාරින් තුන්දෙනෙක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවටද, රියදුරකු කුඩා තේ වතු සංවර්ධන අධිකාරියටද, මුදාහැර තිබූ අතර 2018 වර්ෂයේදී එම නිලධාරීන් වෙනුවෙන් වැටුප් ලෙස රු.1,459,614 ක් හා 2019 වර්ෂයේ රු.1,822,298 ක් අරමුදලෙන් ගෙවීම් කර තිබුණි. | එකඟ වෙමි.<br>තේ ශක්ති අරමුදල සතුව තිබූ GG-6407 අංක දරණ වාහනය වෙනුවෙන් රියදුරු රඳවා ගෙන ඇති අතර, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති තේ ශක්ති සුභසාධන අංශයේ අවශ්‍යතාව මත එම වාහනය සමඟ රියදුරු එම ආයතනය වෙත අනුයුක්ත කර ඇත. අදාළ ආයතනවල එවකට පැවති සේවා අවශ්‍යතා මත අනෙකුත් සේවයකයන් අනුයුක්ත කර ඇති අතර, ඉදිරියේදී අදාළ ආයතන සමඟ සාකච්ඡා කර ඒ පිළිබඳ සමාලෝචනය කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | බාහිර ආයතනයකට මුදාහළ නිලධාරීන්ට ගෙවන ලද වැටුප් ප්‍රතිපූරණය කරගත යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ සේවකයන් විසින් අරමුදලට එරෙහිව කම්කරු විනිශ්චය සභාවල පවරා තිබූ නඩු තීන්දු අනුව 2019 දෙසැම්බර් 31 වන විට සේවකයන්ට ගෙවීමට සිදු වී තිබුණු වන්දි මුදල රු.37,122,988 ක් විය.එසේම සමාලෝචිත වර්ෂයේදී තේ ශක්ති අරමුදලට එරෙහිව කම්කරු විනිශ්චය සභාවල නඩු 38 ක් හා ශ්‍රේෂ්ඨාධිකරණයේ එක් නඩුවක්ද මහාධිකරණයේ නඩු 25 ක් හා වන්දි කම්කරු උසාවියේ එක් නඩුවක්ද විභාගවෙමින් පැවතුණි. | එකඟ වෙමි. | කාර්ය මණ්ඩලයේ සේවය අවසන් කිරීමේදී චක්‍රලේඛ හා අමාත්‍ය මණ්ඩල තීරණ වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව පනතේ නියමකර ඇති පරමාර්ථ ඉටුකිරීම සඳහා සහ අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණයේ ක්‍රියාකාරකම් ඇතුළත්කර දිගුකාලීන දැක්මක් සහිතව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි.<br>තේ ශක්ති අරමුදල අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව මෙම අමාත්‍යාංශයේ වෙනම අංශයක් ලෙස දැනට ක්‍රියාත්මක වන බැවින්, අරමුදල සඳහා වෙනම සංයුක්ත හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොමැත. ඉදිරියේදී ආයතනය පවත්වා ගෙන යා යුතු ආකාරය පිළිබඳ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සැලසුම් සකස් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව රජයේ සෑම නීතිගත සංස්ථාවක් විසින්ම සෑම මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු නමුත් 2017,2018 හා 2019 යන වර්ෂයන් වෙනුවෙන් අයවැය ලේඛන පිළියෙල කර නොතිබුණි. | එකඟ වෙමි.<br>තේ ශක්ති අරමුදල මේ වනවිට වැවිලි අමාත්‍යාංශයේ වෙනම අංශයක් ලෙස ක්‍රියාත්මක වන අතර, අරමුදල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වියදම් අමාත්‍යාංශය මගින් දරන බැවින්, අදාළ වියදම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ සලසා ගනු ලැබේ. කෙසේ වෙතත් ඉදිරියේදී ලැබිය යුතු ආදායම් හා දැරිය යුතු වියදම් ඇස්තමේන්තුගත කරමින් වාර්ෂික අයවැය සකස් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන අනුව වාර්ෂිකව අයවැය ලේඛනයක් සකස් කළ යුතුය. |